# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2272/41 - 2022 මාර්තු මස 23 වැනි බදාදා - 2022.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ. යොමු අංකය* - DSM/YT/LAND/5/8.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* - 13/96/HA/381.

යටවත්ත ප්‍රාදේශීය ලේකම් නිල නිවස සහ සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාස සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරි පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ අංක E337B, ඩන්ගන් පෙදෙස ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දීවිල්ල ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ මූලික පිඹුරු අංක මා1855 හි සඳහන් ඩන්ගන් වත්ත නැමති ඉඩමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3062 ක් වූ බිම් කොටස.

**කැබලි අංකය** : 01
*බිම් ප්‍රමාණය* - හෙක්ටයාර් 0.3062
*ඉඩමේ නම* - ඩන්ගන් වත්ත
*විස්තරය* - යටවත්ත ප්‍රාදේශීය ලේකම් නිල නිවස සහ සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාස සඳහා ඉඩම් කොටසක් අත්පත් කර ගැනීම
*හිමිකම් කියන අය* - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.04.25 වැනි දින පූ.භා. 10.00ට යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2022.04.01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/ පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

**ඩී. ආර්. කේ. හෙන්නායක,**
ප්‍රාදේශීය ලේකම්,
යටවත්ත.

2022 මාර්තු මස 18 වැනි දින,
යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03-0993

ශුද්ධිපත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ. යොමු අංකය* - YAT/LAN/LANAQ/A5/175.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* - 4-3/15/2016/VE/301.

වර්ෂ 2020ක් වූ දෙසැම්බර් මස 01 වැනි අඟහරුවාදා දින අංක 2204/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීමේ සඳහන් මූ. පි. කැ. 3619 හි කට්ටි අංක 03 හි ප්‍රමාණය සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

කැබලි අංකය : 03 - ඉඩමේ නම :- සඳහන් නොවේ - ප්‍රමාණය : හෙක් :- 0.1279

| | | |
|---|---|---|
| *උතුරට* | - | ලැවන්ට් වත්ත, කැබලි අංක 4, 6, මාර්ගය, කැබලි අංක 1 සහ 2 |
| *නැගෙනහිරට* | - | මාර්ගය, මෙම පිඹුරේ කැබලි අංක 1 සහ මූ. පි. කැ. 1024 හි කැබලි අංක 1 |
| *දකුණට* | - | මූ. පි. කැ. 1024 හි කැබලි අංක 1 සහ 2 |
| *බටහිරට* | - | මාර්ගය, ලැවන්ට් වත්ත, කැබලි අංක 4 සහ 6. |

**එම්. එම්. පී. ප්‍රියංගනී පෙතන්ගොඩ,**
ප්‍රාදේශීය ලේකම්,
යටියන්තොට.

2022 මාර්තු මස 14 වැනි දින,
යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03-0444

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.